කිරීමට ත්, අස්වැන්න වැඩි කිරීමට ත් ලැබෙන ධෛර්යයේ අසම්පූර්ණකම,
(e) අඩු පොලියට මුදල් ණයට ගැනීමේ පිළිවෙළක් නැති වීම.

වී ගොවිතැන දියුණු කිරීම සඳහා පහත සඳහන් ප්‍රකාර ක්‍රියා පිළිවෙළක් අනුව එය නැවත සකස් විය යුතු යි:—

දැනට පළාත් භාර නිලධාරීන් යටතේ සේවයෙහි යෙදී සිටින වෙල් මුලාදෑනීන් ගෙන් දැනට වඩා සාර්ථක අන්දමට ප්‍රයෝජන ගත යුතු යි. මෙකී නිලධාරීන් ගෙන් ද, කෘෂිකර්මාන්ත, වාරි මාර්ග, සමූපකාර, ද්‍රව්‍ය අලෙවි කිරීම යනාදී දෙපාර්තමේන්තුවල නිලධාරීන් ගෙන් ද ඉටුවන සේවයන් අතර සම්බන්ධකම් ඇති කළ යුතු යි.

වර්ධනය කරන ලද, උපකරණ සහ වගාක්‍රම පිළිබඳ අභ්‍යාසකර පෙන්වීම්, ගොවීන්ගේ විශ්වාසය දිනා ගන්නා පිළිවෙළට සකස් කළ යුතු යි.

අදහස මුදුන්පත්වනතුරු, ගොවි තරඟ සහ ප්‍රදර්ශන එක් ස්ථානයක වරින් වර පැවැත් විය යුතු යි.

වැඩිකල් නො ගොස්ම, වී පිළිබඳ කටයුතුවලට පමණක් සීමිත වූ, ගොවිකම් දෙපාර්තමේන්තුවේ කොටසක් පිහිටුවිය යුතු යි. ගොවිකම් දෙපාර්තමේන්තුවේ ත්, වී ගොවිතැනට සහායවන අන්‍ය දෙපාර්තමේන්තුවලත් නිලධාරීන් ගෙන් ඉටුවන කාර්යයන්, ගොවිකම් දෙපාර්තමේන්තුවේ වී පිළිබඳ කාර්යාංශය මගින් සම්බන්ධ කරලීම අවශ්‍ය වේ.

---

## ඉන්දියානුන්ගේ කිරි බීම හා ගව පාලනය.
## The Use of Milk as a Food by Indians and Their Management of Livestock.

(මායා රංජන් විසිනි.)

ලාංකිකයන්ට කිරි බීම පුරුදු කරවීම පිණිස ගන්නා උත්සාහය ළදරු වෙකුට නු පුරුදු රසවත් කෑමක් කවන්නට කරන වෑයමක් මෙනැ'යි කිව යුතු ය. ළදරුවාට ඒ කෑමේ ඇති රසත් ගුණත් කිය කියා පෙරැත්ත කරන්නාක් මෙන් ලාංකිකයාට ද, කිරිවල ඇති රස ගුණ කියන්නෝ දැන් කලක සිට ය. ආහාරයක් වශයෙන් කිරිවල ඇති වැදගත් කම, ලෝකයම විසින් පිළිගත් සත්‍යයක් ව පවතින බව ද ලාංකිකයන් නො දන්නෝ නො වේ. එහෙත් කොතෙක් කීවත් නාහන හිතුවක්කාර ළදරුවකු මෙන් ලාංකිකයා තව ම කිරට පුරුදු වූ බවක් නො පෙණේ.

මට පෙනෙණ හැටියට නම් ලාංකිකයන්ගේ කිරට ඇබ්බැහිය නැති වීමට හේතුව එහි රස ගුණ නො දැනීමම නො වේ. කිරට මෙන් ම ගවයාට ද දක්වන ඇල්ම අඩුකම ත්, ඒ නිසාම කිරි සුලභ නොවීම ත් ඊට හේතු ය.

ඉන්දියාව කිරි බීම, පමණක් නොව ගව පාලනය සම්බන්ධයෙන් ද දෙන්නේ සිත් ගන්නා ආදර්ශයකි. ඉන්දියාවේ විශාල නගරයක වුව ද වීථියක ගමන් කරන්නෙකුට මිනිසුන් සමගම එහා මෙහා හැසිරෙන ගවයන් පමණක් නොව, එළු බැටළු ආදී සතුන් ද දකින්නට ලැබේ. සම්පූර්ණ සනීපයෙන් හා සිත්කළු පෙණීමකින් යුතු එළදෙනක් සමහරවිටක කාසි දී තේවතුර බොන්ට යන්නාක් මෙන් එහි කඩයකට ඇතුළු වනු දැකීම පුදුමයක් නො වේ. ගවයා එහි හැසිරෙන්නේ මිනිසුන් සමග එකම සමාජයෙහි වෙනසක් නැතිව වැඩෙන්නෙකු මෙනි. මාර්ගයේ වාහන පදවන්නනුත්, මගියනුත්, වෙළෙන්දනුත්, ගවයා සලකන්නේ තමන්ගේ හෘදයකු, හිතවතකු මෙනි.

දකුණු ඉන්දියාවේ ගවයන් සම්පූර්ණයෙන් වැඩුණු නිරෝගී ශරීර ඇත්තවුන් නමුත්, එහි බොහෝ ප්‍රදේශවල ලංකාවේ මෙන් සරුලෙස වැඩුණු තණකොළ දකින්ට නො ලැබේ. ඒ නිසා ගෙදර ගවයකු ඇති කරන ගොවියා හෝ ගෙවිලිය වැඩට ගොස් එන ගමන් අනුන්ගේ මිදුලක් හෝ පාරක අයිනක් උදළු ගා එකතු කර ගන්නා තණ කොළ ටිකක් හොඳින් සෝදා කූඩයක දමාගෙන එන්නේ තමන් එනතුරු මග බලා සිටින දරුවෙකුට කෑමක් ගෙන යන ආදරයකිනි. ඔහු ගවයා ට කැවීම පෙවීම කරන්නේත් නෑවීම තෙල් ගැල්වීම ආදිය කරන්නේත් ලොකු සැලකිල්ලකිනි.

හින්දූන්ගේ තෛපොංගල් උත්සව දිනයට පසුවදා මාට්ටු පොංගල්ය. එදාට ඔවුහු ගවයන් ඉතා අලංකාර ලෙස සරසා දේවාල කරා ගෙන ගොස් නොයෙක් පුද පූජා ද පවත්වති. එසේ කෙරෙන්නේ ගවයා ඊශ්වර දෙවියන්ගේ වාහනය වශයෙන් සලකන බැවිනි. එහෙත් ඇත්ත වශයෙන් නම් බමුණන් ඊශ්වර වාහනය සඳහා ගවයා තෝරා ගන්නා ලද්දේ ඔවුන් ගෙන් ලැබුණ ප්‍රයෝජනය හේතු කොට ගෙන ඇති වූ සැලකිල්ල නිසා ය.

මිනිහා එඬේරකු වී කිරෙන් වැඩෙන්ට පටන් ගත්තේ, ගොවියකු වී ධාන්‍ය යෙන් වැඩෙන්ට පටන් ගැනීමට කලිනි. මධ්‍යම ආසියාවේ විසූ ආර්යයෝ ඔවුන්ගේ දිවි පැවැත්මට අවශ්‍ය සියලු දේම ගවයාගේ ආධාරයෙන් ලැබූ හ. පසුව ඔවුන් ගවයාට ඊශ්වර වාහනය වී මේ ගෞරවය දුන්නේ එහෙයිනි.

අදත් ඉන්දියානුන් ගවයා ගෙන් ලබන ප්‍රයෝජනය ත් ගවයාට එතරම් සැලකිල්ලක් දැක්වීමට හේතුව ත් කිරෙන් ලබන පෝෂණය ත් දැන ගැනීමට හින්දූන්ගේ ආහාර ලැයිස්තුවක් පරීක්ෂා කළ යුතු ය. මස්, මාළු කිසිවක් නො කන, යටත් පිරිසෙයින් උම්බලකඩ ටිකක් වත් ආහාරයට නො ලබන හින්දූන් කන තරමක් කන්නේ වම්බටුත්, පරිප්පුත් ය. වෙන එළවළුවක් ගත්තත් එය හැම දාම එකම තාලයකට– එකම පිළිවෙළට තුන පහ යොදා කකාරන හොද්දත් බතත් ය. ඒ බතත් නිතර නො ලබන දුප්පත්තු රට කජු පණමක කෑමෙන් වේල ගෙවති. මෙසේ කන ආහාරය දෙස බැලූ විට ඔවුන් කෙළින් කටින් හිට වැඩක් කිරීම පවා පුදුමයකි. නමුත් ඔවුහු නිරෝගී වැඩුණු ඇඟ පසඟින් යුතුව ශක්තිමත් ශරීර ඇත්තෝ ය. මෙහි ඇති එකම රහස කිරේ පෝෂණය මිස අනිකක් නො වේ.

උදේ හවස බොහෝ විට කිරි බොන ඉන්දියානුවන් මෝරු සමග බත් කෑමට දක්වන්නේ ලොකු රුචි බවකි. හෝටලයේ දී වුවත් ගෙදර දී වුවත්, මාළුවක් සමග බත් ටිකක් කෑ තැන සිට ඔහුගේ කල්පනාව මෝරු වලින් බත පීතෙන්ට හදාගෙන 'සුරු සුරු' ගා ඉහළට අදිමින් කෑම වෙනුවට බීමට ය. මෝරු, දීකිරි, බටර් චිස් ආදී කෑම විදියකින්ම කෑ හැකි වන සේ ඉන්දියාවෙහි කිරි සුලභ ය. පණම් දෙකක් දී පාන් බාගයක් ගන්නා දුප්පතෙකුට වුව ද තවත් පණම් එක හමාරකට බටර් අවුන්සයකුත්, පයිසා තුනක උක් හකුරුත් ගත් කල අඩු වියදමකින් හොඳ කෑමක් සාදා ගත හැකි ය. තවත් පණමක හමාරක පලතුරු හා කිරිත් එකතු වූ කල එය ඉතා පොෂ්‍යදායක ආහාරයක් ද වන්නේ ය. ඉන්දියානුවන් ගවයාට මේතරම් සැලකිලි දක්වීමට මෙසේ ලබන ප්‍රයෝජනය ම කාරණයක් නො වේ යයි කාට කිව හැකි ද?

යටකී දේව සම්බන්ධය අත්හැර දැමුව ද, උගෙන් ලැබෙන ප්‍රයෝජනය නිසා- කිරෙන් ලැබෙන පොෂණය නිසා ගවයාට සැලකිල්ලක්-කරුණාවක් දක්වීමට කාට වුව ද යුතුකම් ඇත්තේ ය. එසේ සැලකිල්ලක් දක්වීම කිරට ඇල්ම දියුණු වීමට ත්, ඒ ඇල්ම ගව පාලනය දියුණු වීමෙන් කිරි සුලභ වීමට ත් හේතු වන්නේය.

එහෙයින් ලාංකිකයන් වැඩියෙන් කිරි පානය නො කිරීම ලෝකයේ ඉතා හොඳ ආහාරයක් අහක දැමීමක් බවත්-ගවයාට වැඩි සැලකිල්ලක් නො දක්වීම යුතුකම් පැහැර හැරීමක් බවත්-එපමණක් නොව එයින් ආර්ථික වශයෙන් රටට ලැබිය හැකි විශාල ප්‍රයෝජනයක් නැතිව යන බවත් මතක් කරමින්, හැකි තරම් කිරි බොන ලෙසත්- ගවදෙනට කිරි මවකගේ සැලකිල්ල ඇති කරන ලෙසත් ඉල්ලා සිටිමු."

බැංගලෝර්,
17-3-46.

---

## කුඹුරුවල සිටින කක්කුට්ටෝ.
## Land Crabs in Paddy Fields.

කක්කුට්ටෝ ගොයම් පැළ විශාල වශයෙන් කා දමත්. ගොයම් පැළ වැවෙන මුල් කාලයේ කුඹුරේ වතුර තිබෙන විට ඔව්හු සැලකිය යුතු විශාල ගොයම් පැළ ප්‍රමාණයකට අනතුරු කරත්. ලංකාව වැනි ගොයම් පැළ සනයට සිටින සේ වපුරන රටක කක්කුට්ටන් ගෙන් සිදුවන අනතුරුය එතරම් භයානක නො වේ. නමුත් පැළ උදුරා සිටවන කුඹුරුවල සහ විශෙෂ පරිශ්‍රම දරා අත්හදා බැලීම් වශයෙන් අස්වද්දන කුඹුරුවලත් කක්කුට්ටන් ගොයම් පැළ කෑපීමෙන් වන හානිය කෙතරම් ද කිව හොත්, ඔවුන් වඳ කිරීම සඳහා කටයුතු සැලැස් වීම බොහෝ සෙයින් ම වැදගත් ය. බොහෝ පළාත්වල, ගොවියන් පැළ සිටවන එක් තැනක වුවමනා පමණට වඩා පැළ කිහිපයක් සිටවීමට හේතුවන කරුණු අතුරෙන් මෙය ද එකකි.